විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක **04/2016**

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10.
2016.05.31

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා නිලධාරීන් සඳහා 2005 අයවැයෙන් යෝජිත පරිදි නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)**

2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) හි විධිවිධාන කෙරේ ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයෙන් දැනටමත් ක්‍රියාත්මක වන අග්‍රහාර යෝජනා ක්‍රමය රාජ්‍ය සේවයේ නිරත දායකයන්ගේ ස්ව කැමැත්ත මත " රිදී යෝජනා ක්‍රමය" සහ "රන් යෝජනා ක්‍රමය"යන නව යෝජනා ක්‍රම දෙකක් යටතේ තවදුරටත් පුළුල් කිරීමටත්, **විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් සඳහා අග්‍රහාර රැකවරණ නමින් නව යෝජනා ක්‍රමයක්** හඳුන්වා දීමටත් කටයුතු කර තිබේ.

03. ඒ අනුව යෝජිත මෙම රක්ෂණ ක්‍රමය විශ්‍රාමිකයින් වෙතින් රුපියල් 200/= ක මාසික දායකත්වයක් මත හඳුන්වා දී ඇති අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/ 2005(VI) හි 04 වන ඡේදයේ නියමයන්ට අනුව පහත කොන්දේසි වලටද යටත් වේ.

3.1 2016.01.01 දින සිට විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධරයන් සහ මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ඉදිරියට විශ්‍රාම ගනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අනිවාර්ය දායකත්වයක් දැරිය යුතු ය.

3.2 මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට දායක මුදල් අයකරනු ලබන අතර 2016.01.01 දින සිට චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින දක්වා කාලය වෙනුවෙන් හිඟ දායක මුදල් අයකිරීමක් සිදුකරනු නොලැබේ.

3.3 ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබනුයේ දායකයා පමණක් වන අතර, දායක මුදල් අය වූ දිනෙන් පසු ඇති වන සිද්ධීන් හා අවස්ථා සඳහා ප්‍රතිලාභ ලබා ගත හැකිය.

3.4 වයස අවුරුදු 70 දක්වා ප්‍රතිලාභ හිමිකම් ලැබිය හැකිය.

3.5 විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ගේ දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අයකර මාසිකව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

**3.6 දායකයා විසින් ප්‍රතිලාභ ඉල්ලුම්පත්‍ර සත්‍ය හා නිවැරදි බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් තහවුරු කර ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ යුතුය.**

04. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ සියලුම විශ්‍රාමිකයින්ට මෙම රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ හිමිවේ.

05. 2016.06.01 දිනෙන් පසුව විශ්‍රාම ලබාගන්නා යම් රාජ්‍ය නිලධාරියෙකු විශ්‍රාම ලබාගන්නා මාසයේදී අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා රාජ්‍ය නිලධාරියෙකු ලෙස පවත්නා රක්ෂණ ක්‍රමය යටතේ දායක මුදල් අදාළ ආයතනය විසින් අයකළ යුතු අතර **ඊළඟ මාසයේ සිට විශ්‍රාමිකයෙකු** ලෙස රුපියල් **200/=** ක වාරිකයද **විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වන අවස්ථාවකදී විශ්‍රාම ගනු ලබන මාසයට පසු මාසයේ සිට අග්‍රහාර රක්ෂණ ක්‍රමයට හිඟ දායක මුදල් අයකිරීමද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සිදුකර ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ලැබේ .**

06. ඉහත 04 හි සඳහන් විශ්‍රාමිකයින්ට පමණක් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමි වන අතර, ඔවුන්ගේ කලත්‍රයාට, අනත්දරුවාට හෝ ආබාධිතයාට ප්‍රතිලාභ හිමි නොවේ. (විශ්‍රාමිකයින් වෙත හිමිවන ප්‍රතිලාභ ඇමුණුම් 01 සඳහන් වේ)

07. ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් හඳුන්වා දී ඇති නව අයදුම් පත්‍රය (ඇමුණුම් 02 ) මෙම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමිකයින් විසින් තම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා භාවිතා කළ යුතු අතර එය ඉහත 3.6 හි පරිදි සහතික කර සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතුය.

08. විදේශගත වූ විශ්‍රාමිකයින් සඳහා ද මෙම ක්‍රමයේ දායකත්වය මත ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005(VI) හි ඇමුණුම් 04 හි සඳහන් ප්‍රතිලාභ පමණක් හිමිවේ. විදේශගත විශ්‍රාමිකයා තම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අදාළ ලියකියවිලි අදාළ විදේශ රටෙහි තානාපති කාර්යාලය හරහා තහවුරු කර ජාතික රක්ෂණභාර අරමුදල වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.

09. අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ අඩුකිරීම් මධ්‍යම දත්ත පද්ධතියේ pension menu ⟶ pension payments ⟶ pension information තුළින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා තොරතුරු ලබා ගත හැකි වේ. එසේම විශ්‍රාමිකයින් හට දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.pensions.gov.lk) තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් (payments information) ඔස්සේ ඔවුන්ගේ අග්‍රහාර අඩු කිරීම් පිළිබඳ තොරතුරු ලබා ගත හැකිය.

10. විශ්‍රාමිකයින් සඳහා සාමාජික කාඩ්පතක් නිකුත් කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කටයුතු කරනු ඇත.

**11.** ජ්‍යෙෂ්ඨ පුරවැසි රක්ෂණය යන මැයෙන් **2008.06.27** දිනැතිව මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක **5/2008** මින් අවලංගු කෙරේ.

12. මෙය ජාතික රක්ෂණ භාර අරමුදලේ එකඟතාවය සහිතව නිකුත් කෙරේ.

13. වැඩිමනත් විස්තර සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ පහත සඳහන් නිලධාරීන් විමසීම මැනවි.

ප්‍රධාන විධායක නිලධාරී 0773423450
සහකාර කළමනාකරු 0718003190

ඒ. ජගත් ඩී. ඩයස්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
1. ජනාධිපති ලේකම් - කරු. දැ. ගැ. සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - එම
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - එම
4. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
5. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. ලේකම් - මුදල් අමාත්‍යාංශය
7. විගණකාධිපති - අ.ක.ස.
8. සභාපති - ජාතික රක්ෂණ භාර අරමුදල

ඇමුණුම 01

**2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005(VI) හි ඇමුණුම 04 ප්‍රකාරව විශ්‍රාමික නිළධාරීන් සඳහා අග්‍රහාර රක්වරණ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ලැබෙන ප්‍රතිලාභ.**

| | ප්‍රතිලාභ වර්ගය | සීමාව |
|---|---|---|
| 01 | රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු | රු.30,000.00 (දිනකට කාමර ගාස්තුව රු.3000/- බැගින් ) |
| 02 | උපදේශක විශේෂඥ වෛද්‍යවරයාගේ නිර්දේශ මත ලබාදෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල් සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වැයවන ශල්‍යකර්ම සඳහා | රු.50,000.00 |
| 03 | ආරෝග්‍යශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබාගැනීමේ දී වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සඳහා ගාස්තු හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු | රු.20,000.00 |
| 04 | සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ඇතුළත් විශේෂඥ සේවා ගාස්තු | රු.20,000.00 |
| 05 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන්ට යටත්ව පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් (පෞද්ගලික ආයුර්වේද රෝහල දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතුය.) | රු.120,000.00 ( උපරිමය) |
| 06 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන් වෙනුවෙන්<br>(අ) එක් සිද්ධියක් සඳහා උපරිමය<br>(ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය | <br>රු.120,000.00<br>රු.150,000.00 |
| 07 | I. රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම්<br>II. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත මිළදී ගන්නා ඖෂධ වියදම් සඳහා (රෝහල් ගතව සිටින කාලයේ දී පමණි )<br>III. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත සිදු කරන වෛද්‍ය පරීක්ෂණ සඳහා (රෝහල් ගතව සිටින කාලයේ දී පමණි ) | රු.5,000.00 (දිනකට රු.500 බැගින්)<br>රු.50,000.00<br>රු.20,000.00 |
| 08 | රජයේ ආයුර්වේද රෝහලක, වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් | රු.5,000.00 (දිනකට රු.500 බැගින්) |

| | | |
|---|---|---|
| 09 | I. පහත සඳහන් හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීම.(උපරිමය)<br>1. Heart Attack- (Myocardial Refraction )<br>2. Coronary Artery Disease ( Coronary by – pass surgery)<br>3. Stroke ( Cerebra Vascular Accident )<br>4. Double (Mitral & Aortic) Value Replacement<br>5. Atrial Septal Defect<br>6. Percutancous Transluminial Cororany Angioplast (PTC)<br>7. Fallot Tetrology<br>8. Bruganda Syndrome<br>9. Implanting Pacemaker – Single<br>10. Implanting Pacemaker – Double<br>11. Mitral Valve Replacement | රු.500,000.00 |
| | II. RF Ablation (උපරිමය) | රු.225,000.00 |
| | III. (අ) පහත ශල්‍යකර්ම සඳහා (උපරිමය)<br>1. Cancer<br>2. Kidney Transplant | රු.200,000.00 |
| | (ආ) පහත සඳහන් ශල්‍ය කර්ම සඳහා<br>3. Reanal Failure<br>4. Major Organ Transplant, such as lung or bone marrow, however this benefit will not be paid to a donor of a major organ<br>5. Paralysis<br>6. Multiple Sclerosis<br>7. Primary Pulmonary Arterial Hypertension<br>8. Fulminate Hepatitis | රු.150,000.00 |
| 10 | ශ්‍රවණ ආධාර | රු.50,000.00 |
| 11 | ස්වාභාවික මරණයක දී<br>හදිසි අනතුරක් මඟින් සිදුවන මරණයකදී | රු.150,000.00<br>රු.600,000.00 |

ඇමුණුම 02

NITF
ජාතික රක්ෂණ භාර අරමුදල
National Insurance Trust Fund

# ජාතික රක්ෂණ භාර අරමුදල

## වෛද්‍ය හා රෝහල් ගාස්තු හිමිකම් ඉල්ලුම් පත්‍රය
## අග්‍රහාර රැකවරණ රක්ෂණ යෝජනා ක්‍රමය. (විශ්‍රාමික)

දැනුම් දීමට අවශ්‍ය
කෙටි පණිවුඩ (SMS) ☐ හෝ
තැපැල් ☐
(අවශ්‍ය මාධ්‍යය ලකුණු කරන්න)

| ඔබගේ හිමිකම අදාල වන්නේ ඉදිරියෙන් ( ✓ ) දමන්න. | | |
|---|---|---|
| වෙනත් රෝග මත | රජයේ රෝහල් ගතවීම | |
| | පෞද්ගලික රෝහල් ගතවීම | |
| හෘද සැත්කමක් | | |
| පිළිකා රෝග | | |
| වකුගඩු රෝග | | |

ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය
(ඡායා පිටපත අමුණන්න) ☐☐☐☐☐☐☐☐☐☐

විශ්‍රාම වැටුප් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

1. ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරු:-

1.1 සම්පූර්ණ නම:- (සිංහලෙන්) පූජ්‍ය / මයා / මිය / මෙනෙවිය
..................................................................................................

මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්)..............................................................

1.2 පුද්ගලික ලිපිනය : (සිංහලෙන්):-..........................................................

1.2 පුද්ගලික ලිපිනය (ඉංග්‍රීසියෙන්)............................................................

1.3 උපන් දිනය:- ..................................................

1.4 දුරකථන අංකය :- නිවස.................................... ජංගම:..............................

2. ඔබ රැකියාව කරන ලද ආයතනයේ නම සහ ලිපිනය..........................................
..........................................................................................................

3. කලත්‍රයාගේ තොරතුරු

3.1 ජාතික හැඳුනුම්පත් අංකය

3.2 නම:.....................................................................................

3.3 සේවා ස්ථානයේ නම සහ ලිපිනය:.........................................................
..........................................................................................

4. බැංකු ගිණුම් පිළිබඳ විස්තරය:-

4.1 බැංකු ගිණුමෙ සඳහන් ඔබගේ නම:..................................................

4.2 ගිණුම් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.3 බැංකුවේ නම:.................................... බැංකු ශාඛාව:.........................................

5. මෙම අයදුම් පතට අදාල වියදම් ජනාධිපති අරමුදලෙන් හෝ වෙනත් ආයතනයකින් ඉල්ලුම්කර හෝ ගෙවීම් කර තිබේ නම් එම විස්තර.

5.1 ආයතනයේ නම සහ ලිපිනය:..........................................................
..........................................................................................

5.2 ගෙවූ මුදල:............................................................................

5.3 හිමිකම් අංකය / යොමු අංකය:..................................................

6. අයදුම්කරුගේ ප්‍රකාශය
ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මම හෝ මගේ කලත්‍රයා මෙම හිමිකම්පෑම ඉහත 05 ජේදයට යටත්ව වෙනත් ආයතනයකින්, වෙනත් ක්‍රමයක් මගින් හෝ ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර හෝ නොමැති බව මම මෙයින් සහතික වෙමි.

දිනය:-....................................

..................................................
අයදුම්කරුගේ අත්සන

7. ග්‍රාම නිළධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය. (අනවශ්‍ය වචන කපා හරින්න.)

ඉහත විස්තර සඳහන් ........................................................................................................ මහතා/ මහත්මියගේ රෝහල් ගතවීම පිළිබඳ ලිපි ලේඛන සත්‍ය හා නිවැරදිබවත් ඔහුගේ / ඇයගේ රක්ෂණ හිමිකම අවශ්‍ය කටයුතු සඳහා නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

අත්සන:....................................................

නම:.........................................................

ග්‍රාම නිළධාරී වසම / අංකය:....................

දිනය:..................................................

(නිල මුද්‍රාව තැබීම අත්‍යවශ්‍යයි)

## අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු ලිපි ලේඛණ

01. රෝග නිශ්චය කාඩ්පතෙහි සහතික කල පිටපත
    (රෝගියාගේ නම, රෝහලට ඇතුලත් වූ දිනය හා රෝහලින් බැහැරවූ දිනය හා ප්‍රතිකාර කල වෛද්‍යවරයාගේ අත්සන හා නිල මුද්‍රාව සඳහන් විය යුතුය.)
02. රෝහල් ගතව සිටි කාලයට අදාලව වෛද්‍ය නිර්දේශ මත මිලදී ගත් ඖෂධ හෝ වෛද්‍ය පරීක්ෂණවලට අදාල බිල්පත් වල මුල් පිටපත් හා වෛද්‍ය නිර්දේශ.
03. පෞද්ගලික රෝහලක නේවාසික ප්‍රතිකාර ගැනීමක් නම් ඊට අදාලව මුදල් ගෙවන ලද අත්තිකාරම් රිසිට්පත් (Deposit Receipts) විස්තරාත්මක බිල්පත (Final Bill) අවසාන ගෙවීමට අදාලව රිසිට්පත් (Final Cash Payment Receipt)

    ඉතා වැදගත්: බිල්පත්වල මුල් පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර සහතික කරනලද හෝ වෙනත් බිල්පත් වල ඡායා පිටපත් සඳහා හිමිකම් ගෙවනු නොලැබේ.
    වෙනත් ආයතනයකින් මුදලක් ප්‍රතිපූර්ණය කර ඇති විටක ශේෂ සහතිකය ලබාගැනීමේදි මෙම නීතිය අදාල නොවේ.

04. ඔබගේ බැංකු ගිණුමේ පිටපතක්.
05. විශ්‍රාම වැටුප් කාඩ්පතෙහි පිටපතක්.
06. ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

## වෙනත් උපදෙස්

1. අයදුම්පත රෝහලින් බැරවී දින 90ක් ඇතුලත ජාතික රක්ෂණ භාර අරමුදලවෙත යොමුකල යුතුය.
2. ඔබ විසින් ඉදිරිපත් කරණලද ලිපිලේඛණ වල පිටපත් ග්‍රාමනිළධාරී මගින් පමණක් සහතික කර ඉදිරිපත් කළ යුතුය, දෙපාර්තමේන්තුවේ ප්‍රධානිය විසින් නම් කරණ ලද බලධාරියා ආයතන ප්‍රධානියා ලෙස පිළිගනු ලැබේ.
3. අග්‍රහාර රැකවරණ රක්ෂණ යොජනා ක්‍රමය යටතේ රෝහලක නේවාසිකව ලබාගන්නා ප්‍රතිකාර සඳහා පමනක් ප්‍රතිලාභ ගෙවීම් කරණ.අතර සාමාජිකයාට පමණක් මෙම රක්ෂණ යොජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවනු ලැබේ.
4. නිසිපරිදි සම්පූර්ණ කරණලද හිමිකම් අයදුම්පත සමග අවශ්‍ය ලිපිලේඛන එකවර නිවැරදිව ඉදිරිපත් කිරීමෙන් කඩිනමෙන් හා ප්‍රමාදයකින් තොරව හිමිකම් ප්‍රතිලාභ ලබාගත හැකි බව සලකන්න.